Australian Government
Department of Home Affairs

# කෝවිඩ්-19 පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර

ඔබට වීසා බලපත්‍රයක් නැති වුවද, නැතිනම් ඔබගේ වීසා බලපත්‍ර තත්වය සම්බන්ධයෙන් පැහැදිලි නැතිවුවද, ඔබ විසින් මහජන සෞඛ්‍යය විධාන අනුගමනය කල යුතුය. ඔබට අසනීප නම්, වෛද්‍ය උපදෙස් ලබා කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කර ගන්න.

ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් මගින් කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර ලබාදීම සිදු කෙරේ.

- ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි
- නිව් සවුත් වේල්ස්
- නොදර්න් ටෙරිටරි
- ක්වීන්ස්ලන්ඩ්
- සවුත් ඕස්ට්‍රේලියා
- තස්මේනියා
- වික්ටෝරියා
- වෙස්ටර්න් ඕස්ට්‍රේලියා

**වික්ටෝරියා ප්‍රාන්තයේ සංක්‍රමණ සෞඛ්‍යය පරීක්ෂණ**

තවදුරටත් ඇති කෝවිඩ්-19 සීමා හේතුවෙන්, වික්ටෝරියා ප්‍රාන්තයේ සියළුම සංක්‍රමණ වෛද්‍ය පරීක්ෂණ තාවකාලිකව නවත්වා ඇත. වැඩිදුර මහජන සෞඛ්‍යය නිවේදනවලට අනුකූලව මෙම තීරණය සමලෝචනය කරනු ඇත.

# මා හට ශිෂ්‍ය වීසා බලපත්‍රයක් ඇත, නැතිනම් ශිෂ්‍ය වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට මම බලාපොරොත්තු වෙමි

## ජාත්‍යන්තර සිසුන් සහ උපාධිදාරීන් හට උපකාර ලබාදීම

ජාත්‍යන්තර සිසුන් සාදරයෙන් පිළිගැනීමට ඕස්ට්‍රේලියාව තවදුරටත් සූදානමින් සිටින අතර ඔවුන් සඳහා මෙය ගුණාත්මකභාවයෙන් යුතු ගමනාන්තයකි. සිසුන් හට උපකාර කිරීම සඳහා රජය මගින් වීසා බලපත්‍ර ක්‍රියාමාර්ග රාශියක් නිවේදනය කර ඇත.

සමහරක් ක්‍රියා මාර්ග සඳහා ව්‍යවස්ථාපිත වෙනස් කිරීම් සිදු කිරීමට අවශ්‍ය බැවින් වැඩිදුර විස්තර සඳහා නිතිපතා සෝදිසියෙන් සිටින්න.

මෙම ක්‍රියාමාර්ග තාවකාලික වන අතර අවශ්‍යතාක් කාලයක් පවතිනු ඇත. [අමාත්‍යවරයාගේ මාධ්‍ය නිවේදනය](https://minister.homeaffairs.gov.au/) බලන්න.

# ශිෂ්‍ය වීසා බලපත්‍ර ගාස්තු

ඔබගේ අධ්‍යයන කටයුතු අවසන් කිරීම සඳහා වැඩිදුර වීසා බලපත්‍රයක් යොමු කිරීමට ඉඩකඩ ලබා දීම සඳහා අපි වීසා අයදුම්පත්‍ර ගාස්තුව ඉවත් කරමු. මෙය අදාල වන්නේ 2020 පෙබරවරි 1 වන දින හෝ ඊට පසු ශිෂ්‍ය වීසා බලපත්‍රයක් දැරූ කෝවිඩ්-19 හේතුවෙන් මුල් වීසා බලපත්‍ර කාලය ඇතුලත සිය අධ්‍යයන පාඨමාලාව අවසන් කර ගැනීමට නොහැකිවූ සිසුන් සඳහාය. මෙම සිසුන් අතර පහත අය ඇත:

- ගමන් සීමා හේතුවෙන් ඕස්ට්‍රේලියාවට පැමිණීමට නොහැකිවීම නිසා සිය අධ්‍යයන කටයුතු ප්‍රමාද කල අය
- සිය අධ්‍යයන කටයුතු අර්ධ කාලීන ලෙස කිරීමට සිදුවූ අය
- සිය රැකියා පදනම්වූ පුහුණු සහ/හෝ රැකියා ස්ථාපන සම්පූර්ණ කිරීමට අසමත්වූ අය.

මෙම ක්‍රියා මාර්ග සාමාන්‍ය හේතූන් මත නව ශිෂ්‍ය වීසා බලපත්‍රයකට අයදුම් කරන අය හට අදාල නොවේ (පාඨමාලාවක් හෝ අධ්‍යයන ඒකකයක් අසමත්වීම, පුද්ගලික හේතු මත අධ්‍යයන කටයුතු ප්‍රමාද කල හෝ ස්වේච්ඡාවෙන් අධ්‍යයනය කරන ඒකක ප්‍රමාණය අඩු කරගත් අය ඇතුළුව).

ඔබගේ අයදුම්පත්‍රය වීසා අයදුම්පත්‍ර ගාස්තුව ඉවත් කිරීම සඳහා සුදුසුකම් ලැබීම සඳහා, ඔබ ශිෂ්‍ය වීසා බලපත්‍රයකට අයදුම් කල යුතු අතර ඔබගේ වලංගු වීසා අයදුම්පත්‍රය සමඟ ඔබගේ අධ්‍යාපන සපයන්නා වෙතින් ලබාගත් සම්පූර්ණකල කෝවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක්වූ සිසුන් සඳහාවූ 1545 පෝරමය (PDF – 228 KB) ඇමිණිය යුතුය.

මෙම වීසා බලපත්‍රය සඳහා මාර්ගගතව අයදුම් කල යුතුය. ඔබ අයදුම් කරන අවස්ථාවේ ඕස්ට්‍රේලියාව තුල හෝ පිටත සිට අයදුම් කල හැකිය.

මෙම ගාස්තුව ඉවත් කිරීම අදාල වන්නේ වීසා අයදුම්පත්‍ර ගාස්තුව සම්බන්ධයෙන් පමණි.

දැනටමත් වීසා බලපත්‍රයකට අයදුම්කර ඇති සිසුන් හට නැවත මුදල් ලබාදීමක් සිදු නොවේ. මෙම ගාස්තුව ඉවත් කිරීමට සුදුසුකම් ලබන්නේ නව වීසා අයදුම්පත්‍ර සම්බන්ධයෙන් පමණි.

# කෝවිඩ්-19, 1545 පෝරමය

සිසුන් ඉහත දක්වා ඇති නිර්ණායන සපුරාලන බවට අධ්‍යාපනය සපයන්නන් විසින් සෑහීමකට පත්විය යුතුය.

පෝරමයේ 6 සහ 7 ප්‍රශ්න සම්පූර්ණ කල යුත්තේ සිය අධ්‍යයන කටයුතු ප්‍රමාද කල සිසුන් වෙනුවෙන් පමණි.

සම්පූර්ණ කරන ලද පෝරමය සමඟ සිසුන් විසින් තමා හට කෝවිඩ්-19 බලපෑ ආකාරය සම්බන්ධ වැඩිදුර සාක්‍ෂිද ඉදිරිපත් කල හැකිය.

# තාවකාලික උපාධිදාරී (උපකාණ්ඩ 485) (Temporary Graduate (Subclass 485)) වීසා බලපත්‍ර සඳහාවූ සුදුසුකම

කෝවිඩ්-19 මගින් බලපෑමකට ලක්වූ අය සම්බන්ධයෙන් තාවකාලික උපාධිදාරී (උප කාණ්ඩ 485) වීසා බලපත්‍රයක් සඳහාවූ අවශ්‍යතාවයන් අප විසින් වෙනස් කර ඇතː

- දැනට ශිෂ්‍ය වීසා බලපත්‍ර ඇති සහ නව ශිෂ්‍ය වීසා බලපත්‍රධාරීන් සම්බන්ධයෙන් කෝවිඩ්-19 ගමන් සීමා හේතුවෙන් මාර්ගගත ආකාරයට ඕස්ට්‍රේලියාවෙන් පිටත සිට සිදුකල අධ්‍යයන කටයුතු, ඕස්ට්‍රේලියානු අධ්‍යයන අවශ්‍යතාවය (Australian Study Requirement) සඳහා ගණන් ගනු ඇත.

**මෙම වෙනස දැනට ක්‍රියාත්මකවේ.**

- කෝවිඩ්-19 ගමන් සීමා හේතුවෙන් බලපෑම් ඇතිවූ උපාධිදාරීන් සඳහා ඕස්ට්‍රේලියාවෙන් පිටත සිට තාවකාලික උපාධිදාරී වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට සහ එය ප්‍රදානය කිරීමට හැකියාව ලැබේ (අනෙක් සියළු අවශ්‍යතාවයන් සපුරාලන අවස්ථාවලදී).

**මෙම වෙනස තවම ක්රියාත්මක නොවේ. වැඩිදුර විස්තර සඳහා සෝදිසියෙන් සිටින්න.**

# එතෙර ශිෂ්‍ය වීසා බලපත්‍ර ප්‍රදානය

අප විසින් වීසා අයදුම්පත්‍ර සලකා බැලීම දිගටම සිදුකල අතර, ඕස්ට්‍රේලියාවෙන් පිටත සිටින සිසුන් වෙනුවෙන් ඉදිරිපත් කල ශිෂ්‍ය වීසා අයදුම්පත්‍ර සම්බන්ධ සියළු අවශ්‍යතාවයන් සපුරාලන අවස්ථාවලදී එම වීසා බලපත්‍ර ප්‍රදානය කිරීම අප විසින් නැවත අරම්භ කර ඇත.

ගමන් සීමා ක්‍රියාත්මකව පවතින අතර ඔබට ඕස්ට්‍රේලියාවට පැමිණිය නොහැක.

# අමතර තොරතුරු සඳහා සුනම්‍ය කාල සීමා - ඉංග්‍රීසි විභාග, ජීවමිතික දත්ත සහ සෞඛ්‍යය

කෝවිඩ්-19 හේතුවෙන් ඔබට ඉංග්‍රීසි විභාගයකට ඉදිරිපත්වීමට නොහැකිවුණි නම්, ඔබගේ ඉංග්‍රීසි භාෂා විභාග ප්‍රතිඵල ලබාදීමට අපි අමතර කාලය ලබාදෙමු. කෝවිඩ්-19 හේතුවෙන් ජීවමිතික දත්ත ලබා ගැනීම සහ සෞඛ්‍යය පරීක්ෂණ කිරීමේ සේවාවන්වලට ප්‍රවේශවීමට නොහැකිවුණි නම්, ඒ සඳහාද අමතර කාලය ලබාදෙනු ඇත.

මෙම සේවාවන්ගෙන් එකකට හෝ වැඩි ප්‍රමාණයකට දින 28 කට වඩා වැඩි කාලයක් ඉදිරියෙන් හමුවීමක් පිළියෙල කරගත් අවස්ථාවක, ඔබගේ හමුවීම සම්බන්ධ සනාථ කිරීමේ ලියවිල්ල ImmiAccount හි අමුණන්න.

# වත්මන් ශිෂ්‍ය වීසා බලපත්‍ර සම්බන්ධ කොන්දේසි

කෝවිඩ්-19 සීමා හේතුවෙන් ශිෂ්‍ය වීසා බලපත්‍ර කොන්දේසි සපුරාලීමට නොහැකිවූ අවස්ථාවල අපි සුනම්‍ය ප්‍රවේශයක් ගනිමු. පහත අවස්ථාවල ඔබගේ වීසා බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය වන්නේ නොමැත:

- පාඨමාලා අධ්‍යයනය සම්බන්ධ ප්‍රමාදයක් අනුමත කර ඇති විට
- මාර්ගගතව අධ්‍යයන කටයුතු සිදු කරන විට.

ඔබ පහත අවස්ථාවකට යටත්වේ නම්, සති දෙකකට පැය 40 කට වඩා වැඩ කිරීමටද තාවකාලිකව අවසර ඇත:

- සෞඛ්‍යය ක්ෂේත්‍රයේ සේවයේ නියුතුනම්, සෞඛ්‍යයට අදාල ක්ෂේත්‍රයක පාඨමාලවක් හදාරන විට (හෙද හෝ වෛද්‍ය වැනි) සහ කෝවිඩ්-19 ට එරෙහි ප්‍රයත්නයේදී සෞඛ්‍යය නිලධාරියෙකු විසින් ඒ සඳහා උපකාර කරන ලෙස විධානය කර ඇති අවස්ථාවක
- වෘද්ධෝපගත රැකවරණ සම්බන්ධ අනුමත කල සැපයුම්කරුවෙකු හෝ කොමන්වෙල්ත් රජය මගින් අරමුදල් සපයන වෘද්ධෝපගත රැකවරණ සේවා සපයන්නෙකු සමඟ සේවයේ නියුතුව සිටීම
- ලියාපදිංචිවූ ජාතික ආබාධිත රක්ෂණ වැඩසටහන් සැපයුම්කරුවෙකු සමඟ සේවයේ නියුතුව සිටීම.

ශිෂ්‍ය වීසා බලපත්‍රධාරීන් සඳහා වැඩ කරන වේලාවන්හි තාවකාලික ලිහිල් කිරීම බලන්න

# දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම

ඔබ නැවත සිය මව් බිමට පැමිණියේ නම් හෝ ඔබගේ අධ්‍යයන තත්වය වෙනස් වූයේ නම්, ඔබ විසින් දෙපාර්තමේන්තුවට දැනුම් දීමට අවශ්‍ය නැත. ඔබ විසින් නැවත වීසා බලපත්‍රයකට අයදුම් කරන තෙක් හෝ ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත් වන තෙක් ඔබගේ වීසා බලපත්‍රය වලංගුව පවතී. ඔබ නැවත සිය මව් බිමට පැමිණියහොත් හෝ

ඔබගේ අධ්‍යයන කටයුතු ප්‍රමාද කලහොත්, ඔබගේ වීසා බලපත්‍රයේ තත්වය වෙනස් නොවේ.

අධ්‍යාපනය සපයන්නන් විසින් නව ඇතුලත්වීම සනාථ කිරීම් (CoE) නිකුත් කල හැකි අතර සිසුන් හට මාර්ගගතව අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා පාඨමාලාවලට ඇතුලත් කර ගත හැකිය. ඔබගේ අධ්‍යාපනය සපයන්නා විසින් ඔබගේ නව CoE ලේඛනය දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. ඔබ විසින් දෙපාර්තමේන්තුවට දැන්වීම අවශ්‍ය නොවේ.

ඔබ විසින් දැනටමත් යොමුකල ශිෂ්‍ය වීසා අයදුම් පත්‍රයක් ඇතිනම්, ඔබගේ CoE ලේඛනය ImmiAccount ඔස්සේ ඔබගේ අයදුම්පත්‍රයට ඇමිණිය හැකිය.

# මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දෙන සිසුන්

ශිෂ්‍ය වීසා බලපත්‍රධාරීන් විසින් ඔවුන් හට ලබාගත හැකි විවිධාකාර උපකාර සම්බන්ධයෙන් සිය අධ්‍යාපන සපයන්නන් සමඟ සම්බන්ධවී සිටින ලෙසට උනන්දු කෙරේ.

බොහෝ විශ්ව විද්‍යාල සහ අධ්‍යාපන සපයන්නන් විසින් සිසුන් හට උපකාර ලබාදේ. මේවා අතර, ගාස්තු ගෙවීම ප්‍රමාද කිරීම, අධ්‍යයන කටයුතු හෝ ගෙවීම් ප්‍රමාද කිරීම, ආහාර සහ ඉදුම් හිටුම් පහසුකම් මෙන්ම මානසික සෞඛ්‍යය සහ වෙනත් වෛද්‍ය උපකාරද ඇතුලත්වේ.

වැඩිදුර විස්තර සඳහා, ඕස්ට්‍රේලියාවේ ඉගෙනීම යන www.studyinaustralia.gov.au/ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න

# ජාත්‍යන්තර සිසුන් නැවත ඕස්ට්‍රේලියාව වෙත පැමිණීම

ආරක්ෂාකාරීවූ විට, ඕස්ට්‍රේලියානු ප්‍රජාව ආරක්ෂා වන ආකාරයට, ජාත්‍යන්තර සිසුන් නැවත ඕස්ට්‍රේලියාවට පැමිණීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

# වැඩිදුර විස්තර

ජාත්‍යන්තර සිසුන් සඳහා තොරතුරු පහත ආකාරයට ඇතුළුව රජයේ ආයතන බොහෝමයකින් ලබාගත හැකියඃ

- නවතම පුවත්, යාවත්කාලීන සහ උපදෙස් ඇතුලත් ඕස්ට්‍රේලියානු රජයේ කෝවිඩ්-19 වෙබ් අඩවිය
- අධ්‍යාපන, කුසලතා සහ රැකියා සම්බන්ධ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය සහ ජාත්‍යන්තර සිසුන් සඳහා ඊමේල් international.students@dese.gov.au
- විදෙස් සිසුන් සඳහා සෞඛ්‍යය ආවරණය සම්බන්ධ තොරතුරු ඇතුලත් සෞඛ්‍යය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය

- කෝවිඩ්-19 ආශ්‍රිත පැමිණිලි සඳහාවූ ජාත්‍යන්තර සිසුන් සම්බන්ධ ඔම්බුඩ්ස්මන් වෙබ් අඩවිය
- ජාත්‍යන්තර සිසුන් සඳහා ලබාග හැකි උපකාර සේවා සම්බන්ධ තොරතුරු සඳහා ඕස්ට්‍රේලියාවේ ඉගෙනීම වෙබ් අඩවිය.